ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම සඳහා වන නිදහස් සටන් මධ්‍යස්ථානය
ஜனநாயகத்தைப் பாதுகாப்பதற்கான செயற்பாட்டு மையம்
FREE ACTION CENTRE FOR THE PROTECTION OF DEMOCRACY

මාධ්‍ය ප්‍රකාශය
2026-09-23

**ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සුරැකීමේ පුළුල් මහජන පෙළගැස්ම සහ ඉදිරි ක්‍රියාමාර්ගය**

නිදහස් සටන් මධ්‍යස්ථානය ආරම්භයේ සිටම ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය, අධිකරණයේ ස්වාධීනත්වය සහ ජනතාවගේ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම වෙනුවෙන් අඛණ්ඩව පෙනී සිටී. එම අරමුණ පෙරදැරි කරගනිමින්, පාර්ලිමේන්තුව නියෝජනය කරන සහ නොකරන විපක්ෂයේ දේශපාලන පක්ෂ, බහුජන සංවිධාන සහ සිවිල් බලවේග පුළුල් පොදු වේදිකාවකට එක් කරගැනීම සඳහා අප විසින් පසුගියදා වැදගත් පියවරක් ගනු ලැබීය.

එහිදී ඇති කරගත් පොදු එකඟතාවන්ට අනුව, රටේ ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු පුරවැසියන්ගේ සහභාගීත්වයෙන් ඒකාබද්ධ මහජන විරෝධතාවයක් සංවිධානය කිරීම සඳහා 24 වන දින වෙන් කරගන්නා ලදී. එහි මූලික අරමුණ වූයේ කිසියම් පක්ෂයක හෝ කණ්ඩායමක පටු දේශපාලන අරමුණුවලින් ඔබ්බට ගොස්, ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට සහ ආයතනික ස්වාධීනත්වයට එල්ල වන ඕනෑම තර්ජනයකට එරෙහිව පුළුල්, සාමකාමී සහ ශක්තිමත් මහජන පෙළගැස්මක් ගොඩනැගීමයි.

කෙසේ වෙතත්, අදාළ වැඩසටහන සම්බන්ධයෙන් පසුව මතුවූ විවිධ අදහස්, ප්‍රකාශ සහ ක්‍රියාමාර්ග හේතුවෙන්, අපේක්ෂා කළ පරිදි සියලු පාර්ශ්වයන්ගේ සහභාගීත්වයෙන් යුත් එම පුළුල් ඒකාබද්ධ මහජන ක්‍රියාමාර්ගය ඉදිරියට ගෙන යාමට අභියෝගකාරී තත්ත්වයක් උද්ගත වී තිබේ.

වර්තමාන තත්ත්වය තුළ ප්‍රජාතන්ත්‍රවාදී බලවේග අතර පුළුල් එකඟතාව, අන්‍යෝන්‍ය විශ්වාසය සහ විනිවිදභාවය අත්‍යවශ්‍ය බව අපි විශ්වාස කරමු. එවැනි පොදු එකමුතුවක් ගොඩනැගීම සඳහා පවතින අවකාශය දුර්වල වීම අවසානයේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සුරැකීමේ පොදු අරමුණට අහිතකර විය හැකි බවද අප අවධාරණය කරමු.

ඒ අනුව, ඇතිවී තිබෙන තත්ත්වය සහ පවතින මතභේදාත්මක වාතාවරණය සැලකිල්ලට ගනිමින්, 24 වන දින සඳහා සැලසුම් කර තිබූ ඒකාබද්ධ වැඩසටහනේ නිල සහභාගීත්වයෙන් ඉවත් වීමට නිදහස් සටන් මධ්‍යස්ථානය තීරණය කර ඇත.

අපගේ අරමුණ වූයේ විපක්ෂයේ සියලු දේශපාලන පක්ෂ, කණ්ඩායම් සහ ප්‍රජාතන්ත්‍රවාදී බලවේග එක් පොදු වේදිකාවකට එක් කරමින්, ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සුරැකීම සඳහා පුළුල් හා ශක්තිමත් මහජන බලයක් ගොඩනැගීමයි. එම පොදු වැඩපිළිවෙළ මේ අවස්ථාවේදී අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබීම පිළිබඳව අපගේ කණගාටුව පළ කරමු.

එසේ වුවද, විපක්ෂයේ විවිධ දේශපාලන පක්ෂ, සංවිධාන සහ කණ්ඩායම් විසින් 24 වන දින තනිව හෝ වෙන් වෙන්ව සංවිධානය කරනු ලබන විරෝධතා සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමාර්ගවලට සහභාගී වීමට ඔවුන්ට ඇති නීත්‍යානුකූල හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතියට අපි සම්පූර්ණ ගෞරවය දක්වමු.

එබැවින්, අධිකරණයේ ස්වාධීනත්වය, නීතියේ ආධිපත්‍යය සහ පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සුරැකීම වෙනුවෙන්, 24 වන දින තමන් සිටින ස්ථානයේ සිට හෝ තමන්ට හැකි සාමකාමී සහ ප්‍රජාතන්ත්‍රවාදී ඕනෑම ආකාරයකින් සිය අදහස හා විරෝධය ප්‍රකාශ කරන ලෙස රටේ සියලු දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන, බහුජන සංවිධාන සහ ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු පුරවැසියන්ගෙන් අපි ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

එමෙන්ම, විවිධ දේශපාලන පක්ෂ සහ කණ්ඩායම් විසින් 24 වන දින සංවිධානය කරනු ලබන සාමකාමී විරෝධතා සහ අනෙකුත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමාර්ග සඳහා සහභාගී වී, තම ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් වෙනුවෙන් හඬ නැගීමටද අපි ජනතාව දිරිමත් කරමු.

153/20, නාවල පාර කොළඹ 05
153/20, Nawala Road Colombo 05
153/20, நாவல வீதி, கொழும்பு 05
0772 900 900
facfpod@gmail.com

අද ඇතිවී තිබෙන තත්ත්වය අවසානයක් නොව, වඩාත් පුළුල් හා ස්ථිර ප්‍රජාතන්ත්‍රවාදී එකමුතුවක් ගොඩනැගීම සඳහා වූ තවත් එක් අවස්ථාවක් ලෙස අපි සලකමු.

ඉදිරි කාලය තුළ පක්ෂ දේශපාලනයේ සීමාවන්ගෙන් ඔබ්බට ගොස්, විනිවිදභාවයෙන් යුතු, අන්‍යෝන්‍ය ගෞරවය මත පදනම් වූ සහ සැබෑ මහජන අභිලාෂයන් නියෝජනය කරන පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී එකමුතුවක් ගොඩනැගීම සඳහා නිදහස් සටන් මධ්‍යස්ථානය අඛණ්ඩව කැපවන බව මෙයින් අවධාරණය කරමු.

සංවිධායක මණ්ඩලය
නිදහස් සටන් මධ්‍යස්ථානය

153/20, නාවල පාර කොළඹ 05
153/20, Nawala Road Colombo 05
153/20, நாவல வீதிஇ கொழும்பு 05
0772 900 900
facfpod@gmail.com